ඌව පරණගම ප්‍රාදේශීය සභාව - 2022

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පරණගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඌව පරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණු රු.25,021,311 ක් ප්‍රාග්ධන ආධාර ලෙසට සහ වැය කළ මුදල ප්‍රාග්ධන වියදම් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැසිකිළි ආධාර සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා ලබාදීමට සැලසුම් කර තිබුණු රු.2,985,000 ක් වූ කර්මාන්ත 18 ක් ඉටු නොකර ණය හිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැසිකිළි ආධාර සඳහා ණය හිමි රු.1,400,000 ක මුදල කපා හැරීමට කළමනාකරණ කමිටු නිර්දේශ ලබා ගැනීමට යොමු කර ඇති බව. | -එම- |
| (ඇ) | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි රු.127,564,613 ක වටිනාකම දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඈ) | බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිව පවරා තිබුණු නඩු කටයුතු 03 ක් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශනවල නඩු පිළිබඳ තොරතුරු හෙළිදරව් කරන බව. | නඩු කටයුතු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු.1,158,356 ක තොග ශේෂය භෞතික පැවැත්ම උප ලේඛන හෝ තොග සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | | | |
| | (i)19 රීතිය | උප පත්‍රිකා පොත්වල සුරක්ෂිතභාවය හා නිසි භාවිතය පිළිබඳ සභා ලේකම් පෞද්ගලිකව වගකිව යුතු වුවද, නිල මුද්‍රා තබා නොතිබුණු රු.72,500ක ප්‍රවේශ පත්‍ර 1350 ක් බෝඹුරු ඇල්ල රථගාලේ ගාස්තු අය කර ගැනීම සඳහා නිකුත් කර තිබුණි. | මේ වන විට සියලුම උප පත්‍රිකා පොත් සඳහා කාර්යාලයේදී නිළ මුද්‍රා තැබීම සිදු කරන බව. | නිල මුද්‍රා තබන ලද උප පත්‍රිකා පොත් විධිමත් පරිදි නිකුත් කළ යුතුය. |
| | (ii)59 රීතිය | සභා සීමාව ඇතුළත පවත්වාගෙන යනු ලබන කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණය කර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | රටේ පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් සමීක්ෂණයක් සිදු කර නොමැති බව. | ප්‍රදේශයේ පවතින කර්මාන්ත සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර ඒවා නියාමනයට ලක් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 104 (4) | 2022 අගෝස්තු 04 දින අනතුරුට පත්ව තිබුණු සභාවට අයත් කැබ් රථයක් සම්බන්ධව අනතුර සිදුවී මාස 07 ක් ගත වී තිබුණද පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මෙතෙක් පූර්ණ වාර්තාවක් ලැබී නොමැති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,018,030 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,308,375 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල්කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,019,540 | 2,993,051 | 2,163,947 | 829,104 | 3,019,540 | 3,164,418 | 2,584,829 | 579,589 |
| (ii) | කුලී | 1,008,480 | 1,054,732 | 907,155 | 147,577 | 1,008,480 | 1,026,737 | 857,972 | 168,765 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,150,000 | 1,237,493 | 1,237,493 | 0 | 1,100,000 | 1,257,646 | 1,257,646 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 1,150,000 | 983,853 | 855,115 | 128,738 | 815,000 | 1,734,050 | 1,488,050 | 246,000 |
| | එකතුව | 6,328,020 | 6,269,129 | 5,163,710 | 1,105,419 | 5,943,020 | 7,182,851 | 6,188,497 | 994,354 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකළ හිඟ ජල ගාස්තු රු.499,154 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල අයකර ගන්නා බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී දැන්වීම් පුවරු හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. එමෙන්ම ප්‍රචාරක දැන්වීම් පුවරු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට ප්‍රචාරක දැන්වීම් පුවරු 27 ක් ලේඛනයට ඇතුළත් කර තිබුණද, ඉන් පුවරු 16 කට අය කරගත යුතු ගාස්තු රු.66,219 ක් අය කරගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදු කර නොමැත. 2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර ඇති බව. | වාර්ෂිකව ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ගාස්තු අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන ආදාහනාගාරය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | ආදාහනාගාරයට හා කසළ කලමනාකරණ මධ්‍යස්ථානයට සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් ප්‍රදේශයේ මහජනතාවට ජලය සැපයීම සඳහා ජල ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර තිබුණද, ජල සාම්පල පරීක්ෂා කර යෝග්‍යතාවය පරීක්ෂා කිරීමෙන් තොරව ජලය ලබාදී තිබුණි. | ජල සාම්පල් පරීක්ෂා කිරීම සහ ඒවා පිරිපහදු කිරීමට විශාල පිරිවැයක් වැයවන බැවින් ලබා දෙන ජලය බීමට නුසුදුසු බවට මහජනතාව දැනුවත් කර ඇති බව. | ජලයේ යෝග්‍යතාව පරීක්ෂා කර මහජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලිය යුතුය. |
| (ඇ) | අතිරේක වැසිකිළි අවශ්‍ය ස්ථාන හඳුනාගෙන වැසිකිළි පහසුකම් සැපයිය යුතු වුවද, සභාවට අයත් බෝඹුරු ඇල්ල සංචාරක ප්‍රදේශය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගෙන් පිළිවෙලින් රු.50 ක් සහ රු.500 ක් වශයෙන් ප්‍රවේශ පත්‍ර ගාස්තු අයකළද, එම ස්ථානයට වැසිකිළි පහසුකම් ලබා දි නොතිබුණි. | වැසිකිළි සඳහා ඉඩමක් ලබා ගැනීමේ ගැටළුව හේතුවෙන් වැසිකිළි ඉදි කිරීම ප්‍රමාද වී ඇති බව. | අවශ්‍ය ස්ථාන හඳුනාගෙන පොදු පහසුකම් ලබා දිය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ලූණුවත්ත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් භූමියේ පස් කැපීම සඳහා තෝරාගත් සැපයුම්කරුවෙකුට ගෙවීමට අදාළ ඇස්තමේන්තු සහ යන්ත්‍ර පැය ගණන සම්බන්ධ කාර්මික නිලධාරි වාර්තාව නොමැතිව සභා අරමුදලින් රු.1,329,200 ක් ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී කාර්මික නිළධාරී වාර්තා ඉදිරිපත් කරන බව. | යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේදී යන්ත්‍ර පැය ගණන සම්බන්ධ ඇස්තමේන්තු සහ වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | තාවකාලික තක්සේරුව සිදුකළ කඩ කාමර සමීක්ෂණයේදී කඩ කාමර 12 ක් අතුරු බදුදී තිබුණු බව හඳුනාගෙන තිබුණද, අතුරු බදු ලබාදීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අදාළ වරද නිවැරදි කරන බව. | අතුරු බදු දී ඇති කඩ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ 02 ඡේදය අනුව වර්ෂ 05 කට වරක් බදු කුලී කාලීනව තක්සේරු කර නොතිබුණි. | 2016 වර්ෂයේ තක්සේරුවක් සිදුකර තිබුණද, කඩ හිමියන්ගේ විරෝධතා හේතුවෙන් සංශෝධිත කුලියක් අය කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 වර්ෂයේදී සභාවට අයත් කඩ කාමර 44 ක් පමණක් තක්සේරු කර තිබුණද, මේ දක්වා තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණි. | 2016 වර්ෂයේ තක්සේරුවක් සිදුකර තිබුණද, කඩහිමියන්ගේ විරෝධතා හේතුවෙන් සංශෝධිත කුලියක් අය කර ඇති බව. | කාලීනව කඩ කාමර කුලී තක්සේරු කර නව ගිවිසුම් වලට එළඹ කඩ කුලී අය කරගත යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බලප්‍රදේශය තුළ සංවර්ධනය කර විකුණා තිබුණු ඉඩම් වලින් සියයට දහයක් වන එකතුව අක්.03 රූඩ්. 01 පර්චස් 25.45 ක් වන ඉඩම් කැබලි 07 කින් ඉඩම් කැබලි 06 ක මායිම් හඳුනා ගෙන අයිතිය තහවුරු කරගෙන නොතිබුණි. එමෙන්ම ඉඩම් කැබලි 07 ම කිසිදු සංවර්ධන කාර්යයක් සිදු නොකර නිෂ්කාර්යව පැවතුනි. | සභා අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින්, මායිම් වෙන් කර ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී ආරක්ෂිත වැටවල් ඉදි කිරීමට කටයුතු කරමි. නිෂ්කාර්ය ඉඩම් ජනාකීර්ණ වූ පසු පොදු කටයුතු සඳහා යොදා ගන්නා බව. | සභාවට අයත් ඉඩම් නිරවුල්ව හඳුනා ගෙන ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |